සැ. යු. - 2022.05.20 දින පළ කරන ලද අංක 2281 ගැසට් පත්‍රයේ I:II (ආ) , II, III, IV (අ) සහ IV (ආ) කොටස් පළ නොවීය.

# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය


**අංක 2,282 - 2022 මැයි මස 27 වැනි සිකුරාදා - 2022.05.27**

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


## IV(ආ) වැනි කොටස - පළාත් පාලනය

(වෙන වෙනම ගොනු කර ගත හැකි පරිදි සෑම කොටසකට ම අයත් එක් එක් භාෂාවකට වෙන වෙනම පිටු අංක යොදා ඇත)


| | පිටුව | | පිටුව |
|---|---|---|---|
| තනතුරු- ඇබෑර්තු .... ... ... | — | පළාත් පාලන සහා ඡන්ද ආඥාපනත යටතේ දැන්වීම් .. | — |
| විභාග, විභාග ප්‍රතිඵල ආදිය ... ... ... | — | ආදායම් හා වියදම් පිළිබඳ ප්‍රකාශන ... ... | 931 |
| බඩුබාහිරාදිය විකිණීම් ... ... ... | — | අයවැය ලේඛන ... ... ... | — |
| පළාත් පාලන නිවේදන ... ... ... | 928 | දේපළ විකිණීම් ... ... ... | — |
| අතුරු ව්‍යවස්ථා ... ... ... | — | විවිධ දැන්වීම් ... ... ... | 933 |


සැ. යු. - (i) විසිඑක්වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය පනත් කෙටුම්පත 2022 මැයි මස 06 වැනි දින *ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ* II වැනි කොටසේ අතිරේකයක් වශයෙන් පළකරන ලදී.

(ii) විසිදෙවන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධන පනත් කෙටුම්පත 2022 මැයි මස 06 වැනි දින *ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ* II වැනි කොටසේ අතිරේකයක් වශයෙන් පළකරන ලදී.

**සතිපතා නිකුත් වන ගැසට් පත්‍රයෙහි පළකිරීම සඳහා භාරගනු ලබන දැන්වීම් පිළිබඳ වැදගත් නිවේදනයයි**

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රයේ* අවසන් පිටුවේ සෑම මාසයක ම මුල් සතියේ දී පළ කරන නිවේදන භාරගන්නා දිනයන් සහ වේලාවන් පිළිබඳව මින් අවධානය යොමු කරනු ලැබේ.

*ගැසට් පත්‍රයේ* පළ කිරීම සඳහා දැන්වීම් භාරගැනීම *ගැසට් පත්‍රය* පළකරනු ලබන දිනයට සති දෙකකට පෙර සිකුරාදා දිනයෙහි දහවල් 12 0 ට අවසන් කරනු ලැබේ. තනතුරු - ඇබෑර්තු, විභාග, ටෙන්ඩර් සහ වෙන්දේසි පිළිබඳ දැන්වීම්වල අවසන් දින සහ වේලාවන් ඒ පිළිබඳව උනන්දුවක් දක්වන අයට ප්‍රමාණවත් කාල වේලාවක් ලැබෙන පරිදි යොදාගත යුතු බවට, සියලු ම දෙපාර්තමේන්තු, සංස්ථා සහ මණ්ඩල යනාදිය වගබලාගත යුතු බව මින් අවධාරණය කෙරේ. පළකිරීම සඳහා එවනු ලබන සෑම දැන්වීමක් ම තනි පැත්තේ පමණක් පැහැදිලිව පිටපත් කළ යුතු ය. නිරවද්‍යතාවය පිළිබඳව කරන විමසීම් සහ පැමිණිලි ගැසට් පත්‍රය පළ වූ දින සිට තෙමසකට පසුව භාරගනු නොලැබේ.

*ගැසට් පත්‍රයේ* පළ කරන සෑම දැන්වීමක් ම *ගැසට් පත්‍රය* පළකරනු ලබන දිනට සති දෙකකට පෙර එනම්, 2022 ජූනි මස 17 වැනි දින පළකරන *ගැසට් පත්‍රයේ* දැන්වීම් 2022 ජූනි මස 03 වැනි දින දහවල් 12 0ට හෝ ඊට පෙර තැපෑලෙන් හෝ ගෙනවිත් රජයේ මුද්‍රණාලයට භාරදිය යුතු ය.

2006 අංක 19 දරන ඉලෙක්ට්‍රොනික ගනුදෙනු පනත - 9 වැනි වගන්තිය

*"යම් ප්‍රකාශනයක්, රීතියක්, නියෝගයක්, නියමයක්, අතුරු ව්‍යවස්ථාවක්, නිවේදනයක් හෝ වෙනත් කිසිවක් ගැසට් පත්‍රයේ පළ කළ යුතු බවට යම් පනතකින් හෝ නීති ප්‍රඥප්තියකින් විධිවිධාන සලස්වා ඇති අවස්ථාවක, ඒ රීතිය, නියෝගය, නියමය, අතුරු ව්‍යවස්ථාව, නිවේදනය හෝ වෙනත් දෙය ඉලෙක්ට්‍රොනික ස්වරූපයේ වන ගැසට් පත්‍රයක පළ කරනු ලැබුවහොත් ඒ විධිවිධානය සම්පූර්ණ කර ඇත්තාක් සේ සැලකිය යුතු ය."*

**ගංගානි ලියනගේ,**
රජයේ මුද්‍රණාලයාධිපති.

2022 ජනවාරි මස 01 වැනි දින,
කොළඹ 08,
රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ දී ය.

මෙම *ගැසට් පත්‍රය* *www. documents.gov.lk* වෙබ් අඩවියෙන් බාගත කළ හැක.

# පළාත් පාලන නිවේදන

## ඉබ්බාගමුව ප්‍රාදේශීය සභාව

ගෝ ඝාතක අඥාපනත ( 1 පරිච්ඡේදය)

මෙහි පහත උපලේඛනයේ සඳහන් අය විසින් එළහරක් මස් කඩයක් සහ ඌරු මස් කඩයක් පවත්වාගෙන යාම සඳහා බලපත්‍ර ඉල්ලමින් අයදුම්පත් මා වෙත ඉදිරිපත් කර ඇති බවත් එම බලපත්‍ර නිකුත්කිරීම පිළිබඳව ඉබ්බාගමුව ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුළ පදිංචි හා ජීවත්වන අයෙක් හෝ අයවලුන් විරුද්ධ වන්නේ නම් ඔහු හෝ ඇය එසේ විරුද්ධ වන්නේ කුමන හේතුවක් පදනම් කරගෙනද යන්න පිළිබඳව විස්තර ලිඛිතව පිටපත් දෙකකින් යුක්තව මෙම දැන්වීම ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රය* IV (ආ) කොටසේ පළ වූදා සිට දින 14 ක් ඇතුළත මා වෙත දන්වා එවිය යුතු බවත් ගෝඝාතක ආඥාපනත යටතේ මෙයින් දැනුම් දෙනු ලැබේ.

ඩබ්. අජිත් කුමාර් වික්‍රමසිංහ,
සභාපති,
ප්‍රාදේශීය සභාව,
ඉබ්බාගමුව.

2022 අප්‍රේල් මස 22 වැනි දින,
ඉබ්බාගමුව ප්‍රාදේශීය සභා කාර්යාලයේ දී ය.

**උපලේඛනය**

| *ඉල්ලුම්කරුගේ නම හා ලිපිනය* | *එළහරක්/ඌරුමස් කඩය පවත්වාගෙන යන ස්ථානය* |
|---|---|
| 01. එම්. එෆ්. නිරවුස් මෙහොමඩ් මයා,<br>තිත්තවැල්ගාල, නිකදළුපොත | ගානිෂ් එළහරක් මස් වෙළඳසැළ, තිත්තවැල්ගාල,<br>අංක 03, තිත්තවැල්ගාල, නිකදළුපොත. |
| 02. ඩබ්. එම්. ශාලුක දිල්ශාන් බණ්ඩාර මයා,<br>දූව සංස්ථාව අසල, මැල්සිරිපුර | දූව සංස්ථාව පාර, මැල්සිරිපුර |

05 -181

---

## අම්බලන්ගොඩ නගර සභාව

1987 අංක 45 දරන නගර සභා පනතේ 46 වැනි වගන්තිය යටතේ නගර සභාව සතු මාර්ග ප්‍රකාශයට පත් කිරීම

මෙහි පහත උපලේඛනයේ සඳහන් කර ඇති මාර්ග, නගර සභා ආඥාපනතේ 469 වගන්තිය මගින් නියම කරන ලද ආකාරයට අම්බලන්ගොඩ නගර සභාව සතු මාර්ගයක් ලෙස සලකනු ලබන බව මහජනතාවගේ දැන ගැනීම සඳහා ප්‍රකාශයට පත් කරනු ලැබේ.

එම්. ඩබ්. අරුණ ප්‍රදීප්,
සභාපති,
අම්බලන්ගොඩ නගර සභාව.

2022 මැයි මස 05 වැනි දින,
අම්බලන්ගොඩ නගර සභා කාර්යාලයේ දී.

උපලේඛනය

| අනු. අංකය | මාර්ගයේ නම | ආරම්භක ස්ථානය | අවසාන ස්ථානය | මාර්ගයේ දිග (m) | මාර්ගයේ පළල (m) |
|---|---|---|---|---|---|
| 01 | දීප්ති ද සිල්වා මාවත | මහ අම්බලන්ගොඩ දූව ප්‍රධාන මාර්ගයේ බවානි කර්මාන්ත ශාලාව අසලින් | මල්ලියා වඩු සමන් ජානක මහතාගේ නිවස දක්වා | 86.70 | 3.20 |

05-161

---

## උඩුනුවර ප්‍රාදේශීය සභාව

1987 අංක 15 දරන ප්‍රදේශීය සභා පනතේ 24(01) වැනි වගන්තිය යටතේ කරනු ලබන දැන්වීමයි

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 24(01) වැනි වගන්තිය ප්‍රකාරව මධ්‍යම පළාතේ මහනුවර දිස්ත්‍රික්කයේ උඩුනුවර ප්‍රාදේශීය සභාව විසින් මෙහි පහත සඳහන් උපලේඛනයේ දක්වා ඇති මංමාවත උඩුනුවර ප්‍රාදේශීය සභාව සතු මංමාවතක් වශයෙන් ප්‍රකාශයට පත් කරනු ලබන බව මෙයින් නිවේදනය කරනු ලැබේ.


මේ පිළිබඳව ප්‍රදේශයේ පොදු ජනතාව විසින් හෝ මංමාවත්වලට අදාළ ඉඩම් වල හිමිකරුවන් ලෙස හිමිකම් පාන පාර්ශවයන් හෝ යම් විරෝධතාවයක් පළ කරන්නේ නම්, මෙම නිවේදනය *ගැසට් පත්‍රයේ* පළ වූ දිනයේ සිට එක් මාසයක් ඇතුළත තමන්ගේ අයිතිය ඔප්පු කිරීම සඳහා 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 24(02) වැනි වගන්තිය ප්‍රකාරව ක්‍රියා කරන ලෙසට මෙයින් දැනුම් දනු ලැබේ. එසේ එවන ලිපි ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතුය.

02. මෙම කාල සීමාව තුළ මෙම නිවේදනය පිළිබඳ යම් විරෝධතාවයක් නොවුණහොත් උපලේඛනයේ සඳහන් මංමාවත උඩුනුවර ප්‍රාදේශීය සභාව සතු මංමාවතක් වශයෙන් පිළිගෙන පාලනය කරනු ලබන බව පොදු ජනතාවගේ දැන ගැනීම සඳහා මෙයින් ප්‍රකාශයට පත් කරමි.

ටී. එම්. ගාමිණී තෙන්නකෝන්,
සභාපති,
උඩුනුවර ප්‍රාදේශීය සභාව,
ගෙලිඔය.

ලියාපදිංචි කළ යුතු මාර්ග

| අනු. අංකය | ග්‍රාම නිලධාරී වසම | මාර්ගයේ නම | ආරම්භය | අවසානය | වම්පස පදිංචිකරුවන් | දකුණුපස පදිංචිකරුවන් | දිග (අඩි) | පළල (අඩි) |
|---|---|---|---|---|---|---|---|---|
| 01 | අංක 63, බඹරදෙණිය | කැන්දකුඹුර පාර | මැද්දේගොඩහේන ඇලියස් වත්ත සිට (වටදෙණිය ප්‍රධාන මාර්ගය අසල) | ජේ. එම්. අනුලාවතී මිය හිමි කැන්දකුඹුර සහ ගෙවත්ත | ජේ. එම්. අනුලාවතී කේ. ජී. එන්. ලක්මාලි | කේ. ජී. එන්. ලක්මාලි ජේ. එම්. අනුලාවතී | 400 | 10 |


M.Tilakarathne
Commisioner ,
369 /2,
utugemunu Mawatha,
awilmada,
andy.
PLAN No: 2091
KGA Lakmali
To Peradeniya
Remaining portion of same land
Lot2
J.M. Anulawathie
PROPOSED ACCESS
Lot I
Lot I A
Road (RDA)
Weliangа Hене Watta
Lot I B
J.M. Anulawathie
K.G.A Lakmali
Remaining portion of same land
From Watadeniya
PLAN
of
Divided portio of lands called
Kende kumbura (part)
(Showing Proposed Road)
Situated at Bambaradeniya in
Meda palatha Korale of Udunuwara
Gramadewa Division - Bambaradeniya
AGA's Division -Udunuwara-Pradesiya Sabawa
KANDY DISTRICT CENTRAL PROVINCE
Approximate Extent
EXTENT
LOT NO. A. R. P. Ha:
I 0. 0 10.00 0.0253
Surveyed on: 23.10.2021
+ Length of Road 400Ft.
A.M. TILAKARATHNE
Mawilmada, Kandy.

# ආදායම් හා වියදම් පිළිබඳ වාර්තා

## පුත්තලම නගර සභාව

මූල්‍ය ප්‍රකාශන ප්‍රසිද්ධියට පත් කිරීම

නගර සභා පනතින් සහ ඒ යටතේ 1939 ජුනි 16 දින හා 8458 අංක දරන *ගැසට්* පත්‍රයෙන් ප්‍රකාශයට පත් කරන ලද නගර සභා සම්බන්ධයෙන් වලංගුව පවත්නා මූල්‍ය රීති මාලාවේ 202 වන රීතියේ සඳහන් විධිවිධාන වලට අනුකූල වන පරිදි පහත උපලේඛන වල සඳහන් පුත්තලම නගර සභාවේ 2021.12.31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වන මූල්‍ය මෙහෙයුම් ප්‍රකාශනය, 2021.12.31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ 2021.12.31 දිනෙන් අවසන් වර්ෂය සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශනය මහජනතාවගේ දැන ගැනීම සඳහා මෙයින් නිවේදනය කරමි.

එම්. එස්. එම්. රෆීක්,
සභාපති,
පුත්තලම නගර සභාව.

2022 අප්‍රේල් 26 වැනි දින,
පුත්තලම නගර සභාවේ දී ය.

උපලේඛන I

**පුත්තලම නගර සභාව**

***2021.12.31 දිනෙන් අවසන් වර්ෂය සඳහා මූල්‍ය මෙහෙයුම් ප්‍රකාශනය***

| *විස්තරය* | *2021.12.31*<br>*රු. ශත* | *2020.12.31*<br>*රු. ශත* |
|---|---|---|
| **මෙහෙයුම් ආදායම** | | |
| රජයේ දායකය | 88,538,201.52 | 88,479,330.47 |
| පුනරාවර්තන ආදායම | 98,793,164.57 | 99,544,467.30 |
| **මුළු මෙහෙයුම් ආදායම** | **187,331,366.09** | **188,023,797.77** |
| **මෙහෙයුම් වියදම්** | | |
| පුනරාවර්තන වියදම් | 192,430,333.81 | 175,701,345.13 |
| මුළු මෙහෙයුම් වියදම | 192,430,333.81 | 175,701,345.13 |
| වර්ෂය සඳහා මෙහෙයුම් අතිරික්තය | (5,098,967.72) | 12,322,452.64 |
| ප්‍රාග්ධන ලැබීම් | 358,935,080.09 | 12,754,225.00 |
| ප්‍රාග්ධන වියදම් | 243,242,989.12 | 114,919,815.82 |
| **වර්ෂය සඳහා මෙහෙයුම් අතිරික්තය/ඌනතාවය** | **110,593,123.25** | **(89,843,138.18)** |

උපලේඛන II

**පුත්තලම නගර සභාව**

**2021.12.31 දිනට මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශනය**

| *විස්තරය* | *සටහන්* | *2021.12.31*<br>*රු. ශත* | *2020.12.31*<br>*රු. ශත* |
|---|---|---|---|
| **වත්කම්** | | | |
| **ජංගම නොවන වත්කම් (ස්ථාවර වත්කම්)** | | | |
| දේපළ පිරියත හා උපකරණ | 1 | 368,734,357.48 | 108,162,388.46 |
| **ජංගම වත්කම** | | | |
| අතැති තොගය | 2 | 19,849,282.84 | 22,626,053.30 |
| සේවක ණය | 3 | 6,663,900.18 | 5,143,980.16 |
| ආදයම් ණයගැති | 4 | 530,151,611.14 | 305,688,970.02 |
| වෙනත් ලැබිය යුතු දෑ | 5 | 3,090,904.74 | 7,365,831.35 |
| ඉදිරියට ගෙවීම් | 6 | 14,465,771.02 | 14,877,326.24 |
| ආයෝජන | 7 | 863,883.89 | 880,903.27 |
| මුදල් හා මුදල් සමාන දෑ | 8 | 5,275,744.65 | 9,772,848.68 |
| **මුළු වත්කම්** | | **949,095,455.94** | **474,518,301.48** |
| හිමිකම් | 9 | 654,787,136.70 | 262,330,884.75 |
| ජංගම නොවන වගකීම් | 10 | 213,231,625.23 | 137,824,792.29 |
| ජංගම වගකීම් | 11, 12, 13 | 81,076,694.01 | 74,362,624.44 |
| **මුළු හිමිකම් හා වගකීම්** | | **949,095,455.94** | **474,518,301.48** |

උපලේඛන III

**පුත්තලම නගර සභාව**

**2021.12.31 දිනෙන් අවසන් වර්ෂය සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශනය**

| **මෙහෙයුම් වලින් ජනිත වූ මුදල් ප්‍රවාහය** | *රු. ශත* | *රු. ශත* |
|---|---|---|
| සමුච්චිත අරමුදලේ ශුද්ධ වැඩි වීම | 392,456,251.95 | |
| කාරක ප්‍රාග්ධනය වෙනස් වීම් වලට පෙර මෙහෙයුම් අතිරික්තය | 392,456,251.95 | |
| තොග, ණයගැති/අනෙකුත් ලැබිය යුතු දෑ (වැඩිවීම)/අඩුවීම | (218,502,289.47) | |
| ණයහිමියන්/ගෙවිය යුතු දෑ වැඩිවීම/(අඩුවීම) | 6,714,069.56 | |
| | | 180,668,032.04 |
| **01. මෙහෙයුම් වලින් ජනිත වූ ශුද්ධ මුදල් ප්‍රවාහය** | | |
| ආයෝජන ක්‍රියාකාරකම් වලින් ජනිත වූ මුදල් ප්‍රවාහය | | |
| දේපළ අත්පත් කර ගැනීම | (260,571,969.02) | |

| මෙහෙයුම් වලින් ජනිත වූ මුදල් ප්‍රවාහය | රු. ශත | රු. ශත |
|---|---|---|
| **02. ආයෝජන ක්‍රියාකාරකම් වලින් ජනිත වූ ශුද්ධ මුදල් ප්‍රවාහය** | | **(260,571,969.02)** |
| **03. මූල්‍ය ක්‍රියාකාරකම් වලින් ජනිත වූ ශුද්ධ මුදල් ප්‍රවාහය** | | |
| දේශීය ණය සහ සංවර්ධන අරමුදලින් ණය ගැනීම | 76,740,000.00 | |
| දේශීය ණය සහ සංවර්ධන අරමුදලින් ණය ගෙවීම | (1,333,167.06) | |
| **04. මූල්‍ය ක්‍රියාකාරකම් වලින් ජනිත වූ ශුද්ධ මුදල් ප්‍රවාහය** | | **75,406,832.94** |
| වර්ෂය තුළ ශුද්ධ චලනයන් | | (4,497,104.04) |
| වර්ෂය ආරම්භයේ මුදල් සහ මුදල් සමාන දෑ | | 9,772,848.69 |
| වර්ෂය අවසානයේ දී මුදල් සහ මුදල් සමන දෑ | | 5,275,744.65 |
| සටහන | | |
| මහජන බැංකුව - ජංගම ගිණුම (පොදු අරමුදල) | 798,758.40 | |
| මහජන බැංකුව - සේවක ණය ගිණුම | 881,775.63 | |
| මහජන බැංකුව - වැට් බදු ගිණුම | 102,436.89 | |
| මහජන බැංකුව - අල්ෆා ගිණුම | 3,492,773.73 | 5,275,744.65 |

05-222

# විවිධ දැන්වීම්

## සංශෝධනයයි

## නියාගම ප්‍රාදේශීය සභාව

2022 වර්ෂය සඳහා සේවා සැපයීමේ දී අය කරනු ලබන ගාස්තු

නියාගම ප්‍රාදේශීය සභාව විසින් 2021 වර්ෂයේ ඔක්තෝබර් 26 වන දින පවත්වන ලද සභා රැස්වීමේ දී යෝජනා අංක 10 යටතේ සභා සම්මත කරන ලද ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ 2021.12.10 දිනැති හා අංක 2255 දරන *ගැසට්* පත්‍රය මගින් ප්‍රකාශිත යෝජනාව, සංශෝධනය කර 2022.04.19 දින පවත්වන ලද සභා රැස්වීමේ දී යෝජනා අංක 02 යටතේ සභා සම්මත කරන ලද බව මහජනතාව වෙත මෙයින් නිවේදනය කරනු ලැබේ.

ප්‍රසාද් වීරක්කොඩි,
සභාපති,
නියාගම ප්‍රාදේශීය සභාව.

2022 අප්‍රේල් මස 20 වැනි දින,
නියාගම ප්‍රාදේශීය සභා කාර්යාලයේ දී ය.

### යෝජනාව

| | | රු. ශත |
|---|---|---|
| 01. | ඔප්පු සාරාංශ අයදුම්පත් ගාස්තු | 100 0 |
| 02. | වරිපනම් නොගෙවන බවට සහතිකයක් | 100 0 |
| 03. | වරිපනම් ගෙවා ඇති බවට සහතිකයක් | 100 0 |
| 04. | වීථිරේඛා හා නොපවරා ගැනීමේ අයදුම්පත් ගාස්තු | 300 0 |
| 05. | ගොඩනැගිලි අයදුම්පත් ගාස්තු | 300 0 |

| | | රු. ශත |
|---|---|---|
| 06. | ඉඩම් අනුබෙදුම් අයදුම්පත් ගාස්තු | 25 0 |
| 07. | මෘත දේහ ආදහනය සඳහා ගාස්තු : | |
| | බල ප්‍රදේශයේ පුරවැසියන්ගේ මෘත දේහ ආදහනය සඳහා | 9,000 0 |
| | බල ප්‍රදේශයෙන් පිටත පුරවැසියන්ගේ මෘත දේහ ආදහනය සඳහා | 11,000 0 |
| 08. | පුස්තකාල සාමාජික ගාස්තු | 50 0 |
| 09. | පුස්තකාල සාමාජිකත්වය අලුත් කිරීමේ ගාස්තු | 25 0 |
| 10. | පුස්තකාල පොතක ප්‍රමාද ගාස්තුව (දිනකට) | 1 0 |
| 11. | බල ප්‍රදේශයෙන් බැහැර පුස්තකාල සාමාජික ගාස්තුව | 150 0 |
| 12. | නියාගම මහජන ක්‍රීඩාංගනය වෙන් කිරීමේ ගාස්තු (දිනකට) | 1,000 0 |
| | අමරගම මහජන ක්‍රීඩාංගනය වෙන් කිරීමේ ගාස්තු (දිනකට) | 1,000 0 |
| | ආපසු ගෙවන තැන්පතු මුදල | 1,000 0 |
| 13. | පිටිගල කරච්ච රැස්වීම් ශාලාව වෙන් කිරීමේ ගාස්තුව (දිනකට) | 1,000 0 |
| | දින භාගයකට 50% | 500 0 |
| | ආපසු ගෙවන තැන්පතු | 2,000 0 |
| | ප්ලාස්ටික් පුටුවක් | 5 0 |
| 14. | පරිසර ආරක්ෂණ බලපත්‍ර ගාස්තුව | 4,400 0 |
| 15. | ජල බවුසර් සේවා ගාස්තුව (බල ප්‍රදේශය තුළ හිස් කි. මී. 10ක සීමාව තුළ ප්‍රවාහනය කිරීම) | |
| | පානීය ජලය සඳහා | 5,000 0 |
| | මාර්ග ඉදිකිරීම හා අලුත්වැඩියා කිරීමේ කටයුතු සඳහා පරිහරණය කිරීම | 7,000 0 |
| | කි. මී. 10ට වඩා වැඩි සෑම කි. මී. එකක් සඳහාම අය කිරීම | 100 0 |
| | අමතර ජල බවුසරයක් සඳහා | 1,000 0 |
| | ජල සම්පාදන මණ්ඩලයේ ජල ඒකකයක් (යුනිට් 01ක් සඳහා) | 125 0 |
| | ජලය සහිතව බවුසරය ස්ථානයේ නතර කර තැබීම (වැඩිවන දිනකට අයිති වේ.) | 1,500 0 |
| 16. | ගල්රෝල මගින් සේවා සැපයීමේ ගාස්තු (පැය 08ක කාලයකට) | 14,500 0 |
| | ගල්රෝල මගින් සේවා සැපයීමේ වැඩිවන පැයකට | 1,240 0 |
| 17. | බැකෝ ලෝඩර් සේවා ගාස්තුව (මීටර් පැයක්) | |
| | සභා බල ප්‍රදේශය තුළ | 3,800 0 |
| | බල ප්‍රදේශයෙන් පිටත | 4,500 0 |
| 18. | කොන්ක්‍රීට් මිශ්‍රණ යන්ත්‍රය දිනකට (පැය 8ක්, ඉන්ධන රහිතව, ක්‍රියාකරු සහිතව) | 4,000 0 |
| | කොන්ක්‍රීට් මිශ්‍රණ යන්ත්‍රය වැඩිවන සෑම පැයකටම | 300 0 |
| 19. | ප්‍රවර්ධන වැඩසටහන් සඳහා අවසර දීමේ බලපත්‍ර ගාස්තුව | 1,000 0 |
| 20. | පිටිගල බස්නැවතුම්පල අසල වෙළෙඳ සංකීර්ණයේ රැස්වීම් ශාලාව වෙන් කිරීමේ ගාස්තුව | 7,000 0 |
| | ආපසු ගෙවන තැන්පතුව | 10,000 0 |

සභා බල ප්‍රදේශය තුළ ඉහතින් සඳහන් කළ සේවා සැපයීමේ දී ගාස්තු නියාගම ප්‍රාදේශීය සභාවට ගෙවිය යුතු බවට යෝජනා කරන්නීය.

05-151

**යක්කලමුල්ල ප්‍රාදේශීය සභාව**

2022 වර්ෂය සඳහා බිම්බදු පැනවීම

යක්කලමුල්ල ප්‍රාදේශීය සභාවට අයත් යක්කලමුල්ල වෙළෙඳ සංකීර්ණය හා බස් නැවතුම්පළ අවට භූමිය තාවකාලික වෙළෙඳ කුටි, ප්‍රචාරක වැඩ සටහන් සඳහා බිම් බදු පැනවීම සම්බන්ධයෙන් 2022.04.08 දින පවත්වන ලද යක්කලමුල්ල ප්‍රාදේශීය සභා රැස්වීමේ අංක 05:1 යටතේ පහත සඳහන් යෝජනාව සභා සම්මත කරන ලද බව මෙයින් නිවේදනය කරමි.

යූ. ජී. පියදාස,
සභාපති,
යක්කලමුල්ල ප්‍රාදේශීය සභාව.

2022 අප්‍රේල් මස 25 වැනි දින,
යක්කලමුල්ල ප්‍රාදේශීය සභාව,
යක්කලමුල්ල.

**යෝජනාව**

යක්කලමුල්ල ප්‍රාදේශීය සභාවට අයත් යක්කලමුල්ල වෙළෙඳ සංකීර්ණය හා බස් නැවතුම්පොළ අවට භූමිය තාවකාලික වෙළෙඳ කුටි, ප්‍රචාරක වැඩසටහන් සඳහා කුලියට දීම වෙනුවෙන් සෑම වර්ග අඩියකටම, පහත උපලේඛනයේ සඳහන් පරිදි බිම් බදු අය කිරීමට ගරු සභාවට යෝජනා කරමි.

*උපලේඛනය*

*ප්‍රචාරණ වැඩසටහන් සඳහා*

- බදු දීම දිනක් වන විට රු. 50.00 ක් ද,
- බදු දීම දින දෙකක් වන විට රු. 45.00 ක් ද,
- බදු දීම දින තුනක් වන විට රු. 40.00 ක් ද,
- බදු දීම දින හතරක් හෝ ඊට වඩා වැඩිවන විට රු. 35.00 ක් ද,

මීට අමතරව ක්‍රීඩා පිටි බදු දීමේ දී,

➢ විනෝද කටයුත්තක දී,

  - නොමිලයේ පෙන්වන සංගීත ප්‍රසංග සඳහා රු. 10000.00 බිම් බද්දක් ද, වෙළෙඳ ප්‍රචාරණ කටයුතු සඳහා රු. 10,000.00 බිම් බද්දක් ද, ප්‍රවේශ පත්‍ර අයකර පෙන්වන සංගීත ප්‍රසංග සඳහා රු. 9,000.00 ක බිම් බදු මුදලක් ද අය කරනු ලැබේ.

*රැස්වීම් ශාලාව වෙන් කිරීමේ දී*

➢ රැස්වීම් ශාලාව වෙන් කිරීම සඳහා රු. 8,000.00 ක නැවත නිදහස් කරන ඇප තැන්පතු මුදලක් හා දිනකට රු. 10,000.00 ක මුදලක් ද (මෙම ගාස්තුව සඳහා ජලය හා විදුලිය, පුටු හා ශාලා පහසුකම් පමණක් අදාළ වේ.)

  රැස්වීම් සහ සම්මන්ත්‍රණ ආදිය සඳහා රැස්වීම් ශාලාව වෙන් කිරීමේ දී
  පාසලකට හෝ ආගමික කටයුත්තකට දිනකට රු. 4,000.00 ක් ද වෙනත් ඕනෑම රාජ්‍ය ආයතනයකට දිනකට රු. 5,500.00 ක මුදලක් ද අයකරනු ලැබේ.
  (මෙම ගාස්තුව සඳහා ජලය හා විදුලිය, පුටු හා ශාලා පහසුකම් පමණක් අදාළ වේ.)

➢ ශබ්ද පරිපාලන පද්ධතිය ලබා ගැනීම සඳහා දිනකට රු. 2,000.00 ක මුදලක් ද, ප්‍රොජෙක්ටර් යන්ත්‍රය සඳහා පැය 01 කට රු. 1,000.00 ක මුදලක් අය කරනු ලැබේ.

05-159/1

## යක්කලමුල්ල ප්‍රාදේශීය සභාව

2022 වර්ෂය සඳහා සහතික පත් සහ වෙනත් ආදායම් මත ගාස්තු පැනවීම

යක්කලමුල්ල ප්‍රාදේශීය සභාව විසින් 2022 වර්ෂය සඳහා සහතිකපත් සහ වෙනත් ආදායම් මත ගාස්තු අය කිරීම සම්බන්ධයෙන් 2022.04.08 දින පවත්වන ලද යක්කලමුල්ල ප්‍රාදේශීය සභා රැස්වීමේ අංක 05:02 යටතේ පහත සඳහන් යෝජනාව සභා සම්මත කරන ලද බව මෙයින් නිවේදනය කරමි.

යූ. ජී. පියදාස,
සභාපති,
යක්කලමුල්ල ප්‍රාදේශීය සභාව.

2022 අප්‍රේල් මස 25 වැනි දින,
යක්කලමුල්ල ප්‍රාදේශීය සභාව,
යක්කලමුල්ල.

**යෝජනාව**

යක්කලමුල්ල ප්‍රාදේශීය සභාවට අයත් නිශ්චල සහ චංචල දේපළ දෛනික කුලී පදනම මත වෙනත් ආදායම් සඳහා 2022 වර්ෂය සඳහා පහත උපලේඛනයේ I තීරයේ සඳහන් අයිතමය සඳහා II තීරයේ සඳහන් ගාස්තුවක් පනවා අය කිරීමට ගරු සභාවට යෝජනා කරමි.

| *I තීරුව* | *II තීරුව* <br> *රු. ශත* |
|---|---|
| • ආදාහනාගාරයේ මෘත ශරීර ආදාහනය සඳහා වන | |
| ❖ අයදුම්පත් ගාස්තු | 250 0 |
| ❖ ආදාහනය කිරීමේ ගාස්තු : | |
| බල ප්‍රදේශයෙන් පිට | 11,000 0 |
| • නාකියාදෙණිය සුසාන භූමියේ නාකියාදෙණිය ග්‍රාම සේවා වසම තුළ පදිංචි අයට පමණක් මෘත ශරීරයක්, | |
| ❖ තැන්පත් කිරීම සඳහා මුදල | 50,000 0 |
| ❖ අයදුම්පත් ගාස්තු | 2,000 0 |

• කොම්පෝස්ට් පොහොර සඳහා,

5kg පැකට් 01 ක් සඳහා රු. 125 0
10kg පැකට් 01 ක් සඳහා රු. 250 0
25kg පැකට් 01 ක් සඳහා රු. 625 0
50kg පැකට් 01 ක් සඳහා රු. 1,250 0

05-159/2

**යක්කලමුල්ල ප්‍රාදේශීය සභාව**

2022 වර්ෂය සඳහා ජල බවුසරය කුලියට ලබා දීමේ ගාස්තු අය කිරීම

යක්කලමුල්ල ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුළ 2022 වර්ෂය සඳහා ජල බවුසරය කුලියට ලබා දීමේ දී ගාස්තු අය කිරීම සම්බන්ධයෙන් 2022.04.08 දින පවත්වන ලද යක්කලමුල්ල ප්‍රාදේශීය සභා රැස්වීමේ අංක 5:03 යටතේ පහත සඳහන් යෝජනාව සභා සම්මත කරන ලද බව මෙයින් නිවේදනය කරමි.

යූ. ජී. පියදාස,
සභාපති,
යක්කලමුල්ල ප්‍රාදේශීය සභාව.

2022 අප්‍රේල් මස 25 වැනි දින,
යක්කලමුල්ල ප්‍රාදේශීය සභාව,
යක්කලමුල්ල.

**යෝජනාව**

යක්කලමුල්ල ප්‍රාදේශීය සභාව සතු ලීටර් 4,000 ක ජල පරිමාවක් ඇති ජල බවුසරය සඳහා පහත සඳහන් පරිදි ගාස්තු අයකිරීමට ගරු සභාවට යෝජනා කරමි.

*ජලය සමග බවුසරය ලබා දීමේ දී එක් දිනකට,*

- ජලය සහිතව රු. 2,500.00 ක් ද,
- ජලය රහිතව රු. 2,000.00 ක් ද අය කරනු ලැබේ.

සභා බල ප්‍රදේශය තුළ ප්‍රවාහනය කිරීම සඳහා රු. 1,000.00 ක් ද, බල ප්‍රදේශයෙන් පිට ප්‍රවාහනය සඳහා රු. 3,000.00 ක මුදලක් ද අය කරනු ලැබේ.

05-159/3

---

**ශ්‍රී ජයවර්ධනපුර කෝට්ටේ මහා නගර සභාව**

මස් හා මාළු අපද්‍රව්‍ය බැහැර කිරීම

2019.04.08 දින පවත්වන ලද මහ සභා රැස්වීමේ දී පහත සඳහන් යෝජනාව සම්මත කරන ලද බව මෙයින් දන්වා සිටිමි.

අයි. එච්. වී. ප්‍රේමලාල්,
නගරාධිපති,
ශ්‍රී ජයවර්ධනපුර කෝට්ටේ මහා නගර සභාව,
රාජගිරිය.

2022 මාර්තු මස 24 වැනි දින,
ශ්‍රී ජයවර්ධනපුර කෝට්ටේ මහා නගර සභා කාර්යාලයේ දී ය.

**යෝජනාව**

- මස්/මාළු කඩවල ව්‍යාපාරික ස්වභාවය (හරක් මස්/එළුමස්/ඌරුමස්/කුකුල් මස් (Farm Shop) කුකුළන් මරා මස් පිණිස විකිණීම)
- බැහැර කරන අපද්‍රව්‍ය ප්‍රමාණය එක් එක් ව්‍යාපාරයේ ස්වභාවය අනුව
- ටෙන්ඩර් කර ලබා දුන් කඩ නොවන කඩවල හරක් මස්/ඌරු මස්/එළුමස්/කුකුළන් මරා මස් පිණිස විකිණීම
- එම ව්‍යාපාරික ස්ථානවලින් බැහැර කරනු ලබන අනෙකුත් කසළ සඳහා බදු අය කිරීම
- කසළ බැහැර කිරීම සඳහා මහා නගර සභාවෙන් දරන පිරිවැය

| *මස්/මාළු වෙළඳ ව්‍යාපාරයේ ස්වභාවය* | *යෝජිත මුදල (රු.)* |
|---|---|
| මාළු කුඩා පරිමාණ (තට්ටු, ලෑලි) | 2,000 0 |
| අනෙකුත් මාළු වෙළඳාම් (වෙළඳ සැල්, කඩ වශයෙන් පවත්වාගෙන යාම) | 5,000 0 |
| Farm Shop කුඩා පරිමාණ (ප්‍රසිද්ධ වෙළඳ නාම යටතේ පවත්වාගෙන නොයන, සියලුම Farm Shop ) | 4,000 0 |
| Farm Shop වෙනත් (ප්‍රසිද්ධ වෙළඳ නාම යටතේ පවත්වාගෙන යන Farm Shop ) | 5,000 0 |
| කුකුළන් මරා මස් පිණිස විකුණන ස්ථාන (පෞද්ගලික) | 12,000 0 |
| කුකුළන් මරා මස් පිණිස විකුණන ස්ථාන (ටෙන්ඩර් කරන ලද) | 8,000 0 |
| ඌරු මස් (පෞද්ගලික) | 10,000 0 |
| (ටෙන්ඩර් කරන ලද) ඌරු මස් | 5,000 0 |
| හරක් මස් (පෞද්ගලික) | 12,000 0 |
| හරක් මස් (ටෙන්ඩර් කරන ලද) | 5,000 0 |
| එළු මස් (පෞද්ගලික) | 8,000 0 |
| එළු මස් (ටෙන්ඩර් කරන ලද) | 3,000 0 |
| සුපිරි වෙළඳ සංකීර්ණ | 8,000 0 |

05-215/1

---

**ශ්‍රී ජයවර්ධනපුර කෝට්ටේ මහා නගර සභාව**

පරිසර බලපත්‍ර සම්බන්ධ ගාස්තු සංශෝධනය කිරීම

2021.10.08 දින පවත්වන ලද මහ සභා රැස්වීමේ දී පහත සඳහන් යෝජනාව සම්මත කරන ලද බව මෙයින් දන්වා සිටිමි.

අයි. එච්. වී. ප්‍රේමලාල්,
නගරාධිපති,
ශ්‍රී ජයවර්ධනපුර කෝට්ටේ මහා නගර සභාව,
රාජගිරිය.

2022 මාර්තු මස 24 දින,
ශ්‍රී ජයවර්ධනපුර කෝට්ටේ මහා නගර සභා කාර්යාලයේ දී ය.

**යෝජනාව**

- "ඇ" බාණ්ඩයට ඇතුළත් කර ඇති කර්මාන්ත ක්‍රියාකාරකම් සඳහා බලපත්‍රයේ සක්‍රීය දිනයේ සිට තෙවර්ෂයක උපරිම කාල සීමාවකට යටත් කිරීම දක්වා ඇති අතර එය වර්ෂයක කාල සීමාවකට ලබා දීම.
- "ඇ" බාණ්ඩයේ දක්වා ඇති කර්මාන්ත කටයුතු සඳහා එක් බලපත්‍රයකට රු. 4,000 0 අය කිරීම
- පවත්නා බලපත්‍රය අවලංගු වීමට මාස 03 කට පෙර අයදුම් කරන කර්මාන්තකරුවන් වෙතින් නියමිත පරීක්ෂණ ගාස්තුවෙන් 50% පමණක් අයකිරීම.
- පවත්නා බලපත්‍රය අවලංගු වීමට මාස 03කට පෙර අයදුම් නොකරන කර්මාන්තකරුවන් වෙතින් නියමිත පරීක්ෂණ ගාස්තුව සම්පූර්ණයෙන්ම අය කිරීම
- පාරිසරික ආරක්ෂණ ඇගයීම් කමිටුවේ සාමාජිකයින්ට රු. 500 0 ක කමිටු දීමනාවක් ලබා දීම
- කර්මාන්ත හිමියා විසින් සපයා ඇති තොරතුරු මත පදනම් ව මධ්‍යම පරිසර අධිකාරියේ අදාළ පළාත් සහ දිස්ත්‍රික් කාර්යාල හෝ පළාත් පාලන ආයතන මගින් අය කළයුතු පරීක්ෂණ ගාස්තුව තීරණය කර අදාළ කර්මාන්ත හිමියා වෙත දන්වනු ලබන අතර එම ගාස්තු පහත දැක්වෙන ලෙස සංශෝධනය කිරීම.

| පැරණි ගාස්තුව | | | නව ගාස්තුව | | |
|---|---|---|---|---|---|
| රු. 1,000,000.00 - 250,000.00 | - | රු. 3,000.00 | රු. 100,000.00 - 200,000.00 | - | රු. 5,000.00 |
| රු. 250,001.00 -5000,000.00 | - | රු. 3,750.00 | රු. 200,001.00 - 300,000.00 | - | රු. 7,500.00 |
| රු. 500,001.00 - 1,000,000.00 | - | රු. 5,000.00 | රු. 300,001.00 - 500,000.00 | - | රු. 10,000.00 |
| රු. 1,000,001.00 සිට ඉහළට | - | රු. 10,000.00 | රු. 500,001.00 - 1,000,000.00 | - | රු. 15,000.00 |
| | | | රු. 1,000,001.00 සිට ඉහළට | - | රු. 22,000.00 |

05-215/2

---

## ශ්‍රී ජයවර්ධනපුර කෝට්ටේ මහා නගර සභාව

### නාගරික ගලි අපවහන සේවාව යාවත්කාලීන කිරීම

2021 පෙබරවාරි මස 09 වැනි දින පවත්වන ලද මහ සභා රැස්වීමේ දී පහත සඳහන් යෝජනාව සම්මත කරන ලද බව මෙයින් දන්වා සිටිමි.

අයි. එච්. වී. ප්‍රේමලාල්,
නගරාධිපති,
ශ්‍රී ජයවර්ධනපුර කෝට්ටේ මහා නගර සභාව,
රාජගිරිය.

2022 මාර්තු මස 24 දින,
ශ්‍රී ජයවර්ධනපුර කෝට්ටේ මහා නගර සභා කාර්යාලයේ දී ය.

**යෝජනාව**

1. දැනට භාවිතයට නොගන්නා අනිකුත් ගලි රථ වහාම ක්‍රියාත්මක වන පරිදි සේවයේ යෙදවීමට සැලැස්වීම
2. දැනට පවත්නා ගලි වාර 02 අනිවාර්යයෙන්ම 03 ක් බවට පත්කිරීම
3. පහත දැක්වෙන පරිදි මුදල් සංශෝධනය කිරීම

| *ගලිරථය* | *සේවාව* | *දැනට අය කරන මුදල රු.* | *සංශෝධිත මුදල රු.* |
|---|---|---|---|
| කුඩා ගලි රථය (2000L) | නිවාස | 2,000 0 | 2,000 0 |
| ලොකු ගලි රථය (4000L) | නිවාස | 2,500 0 | 3,000 0 |
| | | | |
| කුඩා ගලි රථය (2000L) | ආයතනයට | 5,000 0 | 4,000 0 |
| ලොකු ගලි රථය (4000L) | ආයතනයට | 8,000 0 | 5,000 0 |
| | | | |
| කුඩා ගලි රථය (2000L) | සමෘද්ධි | 700 0 | 700 0 |
| ලොකු ගලි රථය (4000L) | සමෘද්ධි | 900 0 | 900 0 |

05-215/3

## ශ්‍රී ජයවර්ධනපුර කෝට්ටේ මහා නගර සභාව

### ව්‍යාපාරික ස්ථානවලින් ඝන අපද්‍රව්‍ය ඉවත් කිරීම සම්බන්ධ කසල සඳහා ගාස්තු

සම්මත අතුරු ව්‍යවස්ථාවේ X කොටසේ 19 හා 20 වගන්ති සහ XI කොටස මගින් පැවරී ඇති බලතල ප්‍රකාරව, ව්‍යාපාරික ස්ථාන වලින් ඝන අපද්‍රව්‍ය ඉවත් කිරීම සඳහා ගාස්තු සම්බන්ධයෙන් 2019.02.14 වන දින පැවති මහ සභා රැස්වීමේ දී පහත සඳහන් යෝජනාව සම්මත කරන ලද බව මෙයින් දන්වා සිටිමි.

අයි. එච්. වී. ප්‍රේමලාල්,
නගරාධිපති,
ශ්‍රී ජයවර්ධනපුර කෝට්ටේ මහා නගර සභාව,
රාජගිරිය.

2022 මාර්තු මස 24 දින,
ශ්‍රී ජයවර්ධනපුර කෝට්ටේ මහා නගර සභා කාර්යාලයේ දී ය.

#### යෝජනාව

ව්‍යාපාරික ස්ථානවල ස්වභාවය වෙනස් වීම, ව්‍යාපාරික ඉඩ ප්‍රමාණයන් පුළුල් වීම සහ ව්‍යාපාරික ස්ථානවලින් ජනනය වන කසළ ප්‍රමාණය වැඩිවීම වැනි හේතුන් මත කසළ ගාස්තු සංශෝධනය සඳහා සළකා බැලීමට ඉදිරිපත් කරමි.

| *පරිශ්‍රය* | *මාසික ගාස්තු ප්‍රමාණය රු.* |
|---|---|
| වාණිජ | |
| වර්ග ප්‍රමාණය වර්ග අඩි 200ට අඩු | 500 0 |
| වර්ග ප්‍රමාණය වර්ග අඩි 200 - 1000 දක්වා | 1,500 0 |
| වර්ග ප්‍රමාණය වර්ග අඩි 1000 - 3,000 දක්වා | 3,000 0 |
| වර්ග ප්‍රමාණය වර්ග අඩි 3,000 ට වැඩි | 5,000 0 |
| කාර්මික | |
| වර්ග ප්‍රමාණය වර්ග අඩි 200ට අඩු | 500 0 |
| වර්ග ප්‍රමාණය වර්ග අඩි 200 - 1000 දක්වා | 1,000 0 |
| වර්ග ප්‍රමාණය වර්ග අඩි 1000 - 3,000 දක්වා | 2,000 0 |
| වර්ග ප්‍රමාණය වර්ග අඩි 3,000 ට වැඩි | 3,000 0 |
| හෝටල් ආපන ශාලා ආපන ශාලා සාත්තු නිවාස | |
| වර්ග ප්‍රමාණය වර්ග අඩි 200ට අඩු | 500 0 |
| වර්ග ප්‍රමාණය වර්ග අඩි 200 - 1000 දක්වා | 1,500 0 |
| වර්ග ප්‍රමාණය වර්ග අඩි 1000 - 3,000 දක්වා | 3,000 0 |
| වර්ග ප්‍රමාණය වර්ග අඩි 3,000 ට වැඩි | 5,000 0 |
| ආගමික ස්ථාන, රජයේ රෝහල් සහ රජයේ ආයතන (ලාභ ලැබීම ඉලක්ක කොට නොගත්) | ගාස්තු අය නොකරේ. |

05-215/4

## ශ්‍රී ජයවර්ධනපුර කෝට්ටේ මහා නගර සභාව

### මස් හා මාළු අපද්‍රව්‍ය බැහැර කිරීම

2018.09.07 වැනි දින පවත්වන ලද මහ සභා රැස්වීමේ දී පහත සඳහන් යෝජනාව සම්මත කරන ලද බව මෙයින් දන්වා සිටිමි.

අයි. එච්. වී. ප්‍රේමලාල්,
නගරාධිපති,
ශ්‍රී ජයවර්ධනපුර කෝට්ටේ මහා නගර සභාව,
රාජගිරිය.

2022 මාර්තු මස 24 දින,
ශ්‍රී ජයවර්ධනපුර කෝට්ටේ මහා නගර සභා කාර්යාලයේ දී ය.

**යෝජනාව**

ශ්‍රී ජයවර්ධනපුර කෝට්ටේ මහා නගර සභා සීමාව තුළ මස් හා මාළු අපද්‍රව්‍ය එකතු කිරීමේ යෝජිත නව ගාස්තු ක්‍රමය

| *මසකට කිලෝ ගණන* | *නිර්දේශිත මුදල* රු. |
|---|---|
| 0 - 200 > | 4,000 0 |
| 201 - 500 > | 6,000 0 |
| 500 - 1,000 > | 8,000 0 |
| 1,000 - 2,000 > | 10,000 0 |
| 2,000 - 4,000 > | 12,000 0 |
| 4,000 - 7,000 > | 15,000 0 |
| 7,000 - 10,000 > | 18,000 0 |
| 10,000 - 15,000 > | 20,000 0 |
| 15,000 - 18,000 > | 25,000 0 |
| 18,000 - 20,000 > | 28,000 0 |
| 20,000 - 25,000 > | 30,000 0 |
| 25,000 - 35,000 > | 35,000 0 |

05-215/5

---

**සංශෝධනයයි**

## ආණමඩුව ප්‍රාදේශීය සභාව

### 2022 වර්ෂය සඳහා ආදාහනාගාර ගාස්තු සංශෝධනය කිරීම

ආණමඩුව ප්‍රාදේශීය සභාව විසින් 2022 අප්‍රේල් මස 07 වැනි දින පවත්වන ලද ආණමඩුව ප්‍රාදේශීය සභා මහ සභා රැස්වීමේ දී යෝජනා අංක 04 යටතේ පහත සඳහන් යෝජනාව සංශෝධනය කර සභා සම්මත කර ඇති බවට මෙයින් නිවේදනය කරමි.

ආර්. එච්. එම්. ප්‍රියන්ත බණ්ඩාර රාජකරුණා
සභාපති,
ආණමඩුව ප්‍රාදේශීය සභාව.

2022 අප්‍රේල් මස 07 වැනි දින,
ආණමඩුව ප්‍රාදේශීය සභාවේ දී ය.

**යෝජනාව**

2022 වර්ෂයට අදාළව ප්‍රාදේශීය සභාව විසින් ආණමඩුව ආදාහනාගාර ගාස්තු 2022.04.08 දින සිට පහත සඳහන් පරිදි අයකළ යුතු බවට යෝජනා කරන්නී ය.

| *අනු. අංකය* | *විස්තරය* | *ගෙවිය යුතු ගාස්තුව (රු.)* |
|---|---|---|
| 01. | බලප්‍රදේශය තුළ පදිංචිකරුවෙකුගේ එක් මෘත ශරීරයක් ආදාහනය කිරීම සඳහා ආදහනාගාරය ලබා දීම | 11,000 0 |
| 02. | බල ප්‍රදේශයෙන් පිටත පදිංචිකරුවෙකුගේ එක් මෘත ශරීරයක් ආදහනය කිරීම සඳහා ආදහනාගාරය ලබා දීම | 13,000 0 |

05-213/1

---

**ආණමඩුව ප්‍රාදේශීය සභාව**

2022 වර්ෂය සඳහා ප්‍රාදේශීය සභාව විසින් අය කරනු ලබන සතිපොළ ගාස්තු ප්‍රකාශයට පත් කිරීම

ආණමඩුව ප්‍රාදේශීය සභාව විසින් 2022 අප්‍රේල් මස 07 වැනි දින පවත්වන ලද ආණමඩුව ප්‍රාදේශීය සභා මහ සභා රැස්වීමේ දී යෝජනා අංක 07 යටතේ පහත සඳහන් යෝජනාව සභා සම්මත කර ඇති බවට මෙයින් නිවේදනය කරමි.

ආර්. එච්. එම්. ප්‍රියන්ත බණ්ඩාර රාජකරුණා,
සභාපති,
ආණමඩුව ප්‍රාදේශීය සභාව.

2022 අප්‍රේල් මස 07 වැනි දින,
ආණමඩුව ප්‍රාදේශීය සභාවෙ දී ය.

**යෝජනාව**

2022 වර්ෂයට අද ාළව ප්‍රාදේශීය සභාව විසින් ආණමඩුව සතිපොළ ගාස්තු 2022.04.08 දින සිට පහත සඳහන් පරිදි අයකළ යුතු බවට යෝජනා කරන්නීය.

| *අනු. අංකය* | *කාණ්ඩය* | *ප්‍රමාණය* | *මුදල රු.* |
|---|---|---|---|
| 01 | එළවළු සිල්ලර | 8' x 8' | 300 0 |
| 02 | එළවළු තොග | 8' x 8' | 200 0 සිට 750 0 දක්වා |
| 03 | කරවල | 8' x 8' | 350 0 |
| 04 | තුනපහ/සිල්ලර බඩු | 8' x 8' | 300 0 |
| 05 | ප්ලාස්ටික් බඩු | 8' x 8' | 300 0 |
| 06 | රෙදිපිළි | 8' x 8' | 300 0 |
| 07 | බුලත් පුවක් | 8' x 8' | 300 0 |
| 08 | පළතුරු | 8' x 8' | 300 0 |
| 09 | රසකැවිලි | 8' x 8' | 300 0 |
| 10 | ඉලෙක්ට්‍රික් බඩු | 8' x 8' | 300 0 |

රථගාල්වල අයකිරීම්

| *අනු. අංකය* | *කාණ්ඩය* | *මුදල රු.* |
|---|---|---|
| 01 | පාපැදියක් සඳහා | 10 0 |
| 02 | යතුරු පැදියක් සඳහා | 20 0 |
| 03 | ත්‍රිරෝද රථයක් සඳහා | 50 0 |
| 04 | මෝටර් රථයක් සඳහා | 50 0 |
| 05 | වෑන් රථයක් සඳහා | 50 0 |
| 06 | ලොරි රථයක් සඳහා | 100 0 |

05-213/2

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.